# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,501—1946ක්වූ ජනවාරි මස 4 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට; එනම්:—මකුල්ගස්වැව යන ගමේ පාඨශාලාවක් අළුතෙන් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවේ නියෝගය පරිදි උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,099. ගම—මකුල්ගස්වැව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහනු; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පාලුවත්ත .. | අවුරුදු 40කට වැඩිවූ පොල්ගස් 11ද, අවුරුදු 30කට වැඩිවූ කොස් ගසක්ද, අතු සෙවිලිකොට මැටිවලින් බැඳ මැටි ගෑවූ බිත්තිවලින් යුත් සෝල ගොඩනැගිල්ලක් සහ කුස්සියක් ඇති වත්ත | මකුල්ගස්වැවේ පදිංචි ඉහලගෙදර හාමිදු වෙල්දුරයා, ඉහලගෙදර පුංචා උපාසකයා, එම් මැණිකා, එම සේදරු, අලුත්ගෙදර කිරිහාමුව, පහලගෙදර කිරිකිරියා, කල්වඩුවාගම පදිංචි කල්වඩුවාගෙදර කුරුන් හාමිදේ, එම මිගේත්දර හාමිදේ, එම් නොත්තා හාමිදේ, රඹාවෙල පදිංචි ලෝකුරුගෙදර පයා හාමිදේ, එම පුංචි හාමිදේ, එම අයිරන්අප්පු යන අයවලුන් වෙත් | 2 0 0 |
| 2 | එම .. | ඕවිබිම .. .. | පහලගෙදර උක්කා, අලුත්ගෙදර පුංචා, එම ලපයා, ඉහලගෙදර පුංචා උපාසකයා සහ ඉහලගෙදර හාමිදු වෙල්දුරයාද වෙත් | 0 0 9 |
| | | | | 2 0 9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම් තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ පෙබරවාරි මස 15වෙනි දින පෙරවරු 10 කාහිසමට කලේගෙදර ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකමද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මම 1945ක්වූ දෙසැම්බර් මස 22වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
මාතලේ ආණ්ඩුවේ උප ඒජන්ත මම්හ.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බෝරකන්දේ ප්‍රසූතාගාරයක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්තපිට පලාත් ආණ්ඩු කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 988. ගම—බෝරකන්ද.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහනු; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පුංචිබෝරකන්ද වත්ත | අවුරුදු 40 පමණ වයස ඇති පොල්ගස් 109ද, අවුරුදු 4 පමණ වයස ඇති පොල්ගස් 15ද, අවුරුදු 20 පමණ වයස ඇති රබර්ගස් 23ද, අවුරුදු 40 පමණ වයස ඇති කොස්ගස් 1ද, සෞඛ්‍යභායක ප්‍රසූතාගාරයද ඇති රබර් සහ පොල්ඉඩම | කොළඹ සිනමන් ගාර්ඩන්ස්, ෆ්ලවර් රෝඩ්හි පදිංචි ඒ. ඒ. ද සිල්වා මහතා | 1 3 36·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම් තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ ජනවාරි මස 28වෙනි දින පෙරවරු 11ගේ කාහිසමට අම්බලන්ගොඩ කානාපයමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකමද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

ඉහත සඳහන් ඉඩම ආණ්ඩුවට ගැනීම සඳහා වම් 1945ක්වූ දෙසැම්බර් මස 7වෙනි දින අංක 9,492 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරනලද දැන්වීම මෙයින් අවලංගුකරනු ලැබේ.

මම 1945ක්වූ දෙසැම්බර් මස 20වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

සී. ඩී. පෙරේරා,
ආණ්ඩුවේ උප ඒජන්ත මම්හ.

ඉඩම් සම්බන්ධ ආඥාපනතේ හත්වෙනි වගන්තියේ 203වෙනි අතුරු වගන්තිය ප්‍රකාරයට, ආණ්ඩුවේ සාමාන්‍ය කාර්‍යය, එනම්:— කම්පලාගම ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් සෑදීමක් මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීමේ සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාශයට පලාත් පාලක භාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

ඇ. ව්. පී. සිතියමේ නො. 6ශේ 12වෙනි අතිරේක නොම්බර 2. ගම—කම්පලාගම, කෝච්චිකොඩිසිරිප්පු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2318 | කෝච්චිකොඩිසිරුප්පු | අවුරුදු 5ශේ සිට 10දක්වාවූ පොල්ගස් 10කින්ද, අවුරුදු 15ක්වූ දිඹුල්ගසකින්ද, අවුරුදු 10ක්වූ කල්ගසකින්ද, අවුරුදු 15ක්වූ මාරගස් අටකින්ද, යුක්තවූ ඉඩම | කම්පලාගම කෝනනායකර් කෝවිලේ භාරකාර කෝච්චිකුඩිසිරුප්පුවේ පදිංචි චයිරවිමුත්තුකුමාරු, කදිර වේලු සින්නතම්බි සහ තවත් අයට අයත්ය | 1 2 35·5 |

එබැවින් ඉඩම අයිතිකාරයන්ගේ අණ්ඩුවේ කල්පනාව කිහිපා-ඔබ පොදුජනයාට දැනගැන්ම සඳහා සවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ හෝ තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1946ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පූර්වභාග 10ශේ කණිසමට කම්පලාගම ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටිත්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටිත්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1945ක්වූ දෙසැම්බර් මස 21වෙනි දින
ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

ඇස්. ඇම්. බර්ජ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

## රජසන්තක රබර් ඉඩම් බදුදීම.

L. W. 5778

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල 1946යේ සිට 1950යේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරිකපා ප්‍රයෝජනගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රිජිස්ටර් කර තිබේ.

2. "Tenders for the right to take the produce of rubber trees" එනම් "රබර්ගස්වල කිරිකපා ප්‍රයෝජන ගැනීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇස්වීලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලක් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1946ක්වූ ජනවාරි මස 22වෙනි දින පෙරවරු 10 වනතුරු බාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පු කරන්ට ඕනෑය. එක එක ඉඩමට වෙන් වෙන්ව ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිති කාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදලෙන් 1/5 කොටසක් එවෙල්ම ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් සම කොටස්වලින් 1947යේ, 1948යේ, 1949යේ, 1950යේ ජනවාරි 1වෙනිදාසින් ප්‍රථම ගෙවන්ට ඕනෑය.

5. කැමැත්ත යන්වෙනොදී ඉඩම හොඳ අන්දමින් තබාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උවමනාකරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදායාම වැලැක්විය යුතුය.

7. බද්ද අවසානවූ වහාම හෝ අවලංගුකලවිට බදුකාරයා වහාමට අනතුරු නොකර ඉඩම නිරවුල්ව භාරදිය යුතුයි.

8. කුපන්දීම සඳහා කාරනා රබර් පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. රබර් පාලකතුමා විසින් නියමකළහොත් ඉඩම් පරීක්ෂා කිරීමට සහ තක්සේරුකිරීමට යන මුදලක් බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

10. වැඩිදුර කාරණ සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

ඕ. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

වර්ෂ 1945ක්වූ දෙසැම්බර් මස 14වෙනි දින
රත්නපුරේදී කච්චේරියේදීය.

කුකුළුකෝරලය.

F. V. P. 241. ගම—පිඹුර.

| නො. | රෙජිස්ටර් නො. | ඉඩම්වල විස්තර. | බිම්පරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 1 | 194S3R148 | 131Y | 7 | 0 | 9 |
| 2 | 194S3R165 | 109 | 3 | 1 | 1 |
| 3 | 194S3R150 | 131M | 0 | 0 | 14 |
| 4 | 194S3R169 | 136A සහ 133E | 1 | 0 | 4 |
| | | **F. V. P. 254. ගම—වරකැල්ගොඩ.** | | | |
| 5 | 195S3R138 | 84S | 0 | 1 | 31 |
| 6 | — | 141F | 0 | 3 | 0 |
| 7 | 195S3R200 | 242H | 6 | 2 | 0 |
| | | **F. V. P. 254E. ගම—වරකැල්ගොඩ.** | | | |
| 8 | — | 16 (කොටසක්) | 0 | 1 | 27 |
| | | **F. V. P. 249 ගම—කෝරලේගොඩ.** | | | |
| 9 | — | 14I | 1 | 3 | 34 |
| | | **F V. P. 240, ගම—ගෙදගල,** | | | |
| 10 | 194S3R131 | 31A | 0 | 0 | 18 |
| 11 | 194S3R135 | 4I සහ 4J | 0 | 0 | 21 |
| 12 | 194E3R27 | 4 | 14 | 2 | 38 |
| 13 | 194S3R174 | 4C (කොටසක්) | 1 | 2 | 0 |
| | | **F. V. P 41 ගම—ගවරගිරිය.** | | | |
| 14 | 192S3R231 | 589J2 | 0 | 0 | 15 |
| 15 | — | 514C සහ 514E | 3 | 0 | 39 |
| 16 | — | 180 (කොටසක්) | 2 | 0 | 0 |
| 17 | — | 280C සහ 280D | 0 | 2 | 8 |
| 18 | — | 200M සහ 200N | 2 | 1 | 19 |
| 19 | — | 186 (කොටසක්) | 1 | 3 | 0 |
| | | **F. V. P. 42. ගම—අයගම.** | | | |
| 20 | — | 114 | 0 | 3 | 23 |
| 21 | — | 116 | 0 | 2 | 6 |
| 22 | — | 116B | 0 | 2 | 2 |
| 23 | — | 98 (කොටසක්) | 0 | 2 | 0 |
| 24 | — | 252N (කොටසක්) | 5 | 1 | 23 |
| 25 | 193S3R200 | 541D | 1 | 1 | 11 |
| 26 | 193S3R247 | 470 | 1 | 1 | 27 |
| | | **කුරුවිටිකෝරලය.** | | | |
| | | **V. P. 343. ගම—ඔබගල.** | | | |
| 27 | 163S1R97 | 189I සහ 189J | 3 | 0 | 31 |
| | | **F. V. P. 331. ගම—දෙහිපහල.** | | | |
| 28 | 160S1R47 | 3F | 3 | 0 | 14 |
| | | **F. V. P. 347. ගම—වෙරළුපප.** | | | |
| 29 | 152S1R55 | 48A | 2 | 3 | 14 |
| | | **F. V. P. 355. ගම—බටහොට.** | | | |
| 30 | — | 127E | 0 | 1 | 4 |
| | | **V. P. 384. ගම—අතුරලිය.** | | | |
| 31 | — | 19A | 0 | 0 | 25 |
| | | **F. V. P. 182. ගම—කිරිඇල්ල.** | | | |
| 32 | — | 25K, 41AK, 41W | 0 | 1 | 11 |
| | | **නවදුන්කෝරලය.** | | | |
| | | **V. P. 410. ගම—ඇල්ලැල්ල.** | | | |
| 33 | 164S1R22 | 53 | 0 | 0 | 8 |
| | | **F. V. P. 92. ගම—මාරපන.** | | | |
| 34 | — | 97G සහ 108N | 1 | 3 | 35 |
| | | **F. V. P. 82. ගම—ඇත්බිය.** | | | |
| 35 | — | 14C, 19 | 2 | 0 | 24 |

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.